# ජාතික අධ්‍යාපන ආයතනය

## ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා උසස් ඩිප්ලෝමාව 2023 / 2024

ජාතික අධ්‍යාපන ආයතනයේ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන ඒකකය මගින් මෙහෙයවන ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවන කණ්ඩායම බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**පාඨමාලාවට බඳවා ගැනීමේ මූලික සුදුසුකම් :**

- අධ්‍යාපන අමාත්‍යාංශය මගින් බඳවා ගත් නවක පාසල් ක්‍රීඩා පුහුණුකරුවකු වීම

හා

- අ.පො.ස. (උ.පෙළ) සමත් වීම හෝ ඊට සමාන සුදුසුකමක් සපුරා තිබීම

**පාඨමාලා විස්තර :**

| | | |
|---|---|---|
| කාලය | - | වසර 02 යි |
| මාධ්‍යය | - | සිංහල / දෙමළ |
| තෝරා ගැනීම | - | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| පැවැත්වීමේ ක්‍රමය | - | සති අන්ත දිනවල (පෙ.ව. 8.30 සිට ප.ව. 4.00 දක්වා) |
| ඉගැන්වීමේ ක්‍රමය | - | ප්‍රායෝගික / මාර්ගගත |
| පාඨමාලා ගාස්තුව | - | රු. 90,000.00 (සමාන වාරික දෙකකින් ගෙවිය හැකිය) මීට අමතරව අනුමත විභාග ගාස්තු ගෙවිය යුතුය. |
| ඉල්ලුම්පත්‍ර ගාස්තුව | - | රු. 2,000.00 |
| ලියාපදිංචි ගාස්තුව | - | රු. 1,000.00 |

- පාඨමාලාව නියමිත පරිදි සම්පූර්ණ කිරීමෙන් පසු ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) IV අධ්‍යාපන මට්ටම සම්පූර්ණ කිරීමේ සහතිකය පිරිනැමේ.

**ඉල්ලුම් කිරීමේ ක්‍රමවේදය**

- මාර්ගගත ක්‍රමයට අයදුම්පත් යොමු කිරීමේ දී පහත පිළිවෙල අනුගමනය කරන්න.
  - ජාතික අධ්‍යාපන ආයතනයේ sp.nie.lk වෙබ් අඩවියේ ඇති (student registration) ශිෂ්‍ය ලියාපදිංචිය වෙත යොමු වන්න.
  - පළමුව ඔබගේ පාඨමාලාව (select your programme) තෝරා ගෙන Next මත click කර අයදුම්පත්‍රය සම්පූර්ණ කරන්න.
  - අනතුරුව ලැබෙන උපදෙස් අනුව අයදුම්පත්‍රයෙහි තොරතුරු නිවැරදි දැයි තහවුරු කර ගන්න.
  - තහවුරු (save) කර පසු, තිරයෙහි ඔබගේ ලියාපදිංචි අංකය සහ පාඨමාලාවේ ගෙවීම් පිළිබඳ තොරතුරු දිස් වේ. එහි ඇති අයදුම්පත්‍ර ගාස්තුව සඳහා ඇති යොමු අංකය (Reference number) සටහන් කරගන්න. එහි අවසානයේ download application click කළ විට ඔබගේ සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය බා ගත කර, විදුහල්පති / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය ඇති ව ඕනෑම ලංකා බැංකු ශාඛාවක ඇති ජාතික අධ්‍යාපන ආයතන තැන්පතු පත්‍රිකාව භාවිතා කර යොමු අංකය (Reference number) හා ඔබගේ විස්තර සටහන් කර රු. 2,000.00 මුදලක් තැන්පත් කර එහි රිසිට් පත අයදුම් පතෙහි අලවා ඔබගේ ලිපිනය සහිත රු. 50/- ක මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් සමග **ඒකක ප්‍රධාන, සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන ඒකකය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම** යන ලිපිනයට 2023 ඔක්තෝබර් 15 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ **ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා උසස් ඩිප්ලෝමා පාඨමාලාව - 2023 / 2024** යනුවෙන් සඳහන් කරන්න.
  - විමසීම් : 0117 601504 (මොහාන් මයා) / 0117 601714 (අරවින්ද මයා) සතියේ දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 4.00 දක්වා අමතන්න.
  - අයදුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනය 2023 ඔක්තෝබර් 15 දින වේ.
  - ඔබගේ ඉල්ලුම් පත්‍රය යම්හෙයකින් ප්‍රතික්ෂේප වුවහොත් ඉල්ලුම්පත්‍ර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

**සැලකිය යුතුයි :** ඔබ ඉල්ලුම් කරන මධ්‍යස්ථානයට ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබුණහොත් එම මධ්‍යස්ථානයෙහි පාඨමාලාව ක්‍රියාත්මක නොකරන අතර, ඔබගේ අභිමතය පරිදි ළඟම මධ්‍යස්ථානයට යොමු කරනු ලැබේ.

**පාඨමාලාව පළාත් නවය නියෝජනය වන පරිදි පහත සඳහන් පරිදි සිංහල මාධ්‍ය මධ්‍යස්ථාන අටක සහ දෙමළ මාධ්‍ය මධ්‍යස්ථාන දෙකක පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත.**

| | | |
|---|---|---|
| 01. | ජාතික අධ්‍යාපන ආයතනය | (සිංහල මාධ්‍යය) |
| 02. | බිංගිරිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | (සිංහල මාධ්‍යය) |
| 03. | රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | (සිංහල මාධ්‍යය) |
| 04. | ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | (සිංහල මාධ්‍යය) |
| 05. | නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | (සිංහල මාධ්‍යය) |
| 06. | රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | (සිංහල මාධ්‍යය) |
| 07. | පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | (සිංහල මාධ්‍යය) |
| 08. | මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | (සිංහල මාධ්‍යය) |
| 09. | මඩකලපුව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | (දෙමළ මාධ්‍යය) |
| 10. | වවුනියාව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | (දෙමළ මාධ්‍යය) |

**මහාචාර්ය ප්‍රසාද් සේතුංග**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය,**
**මහරගම.**